**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2023**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | ආයතනයේ සියලුම අතිරික්ත මුදල්, අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.80,000,000ක අතිරික්ත මුදලක් ආයෝජනය කර තිබුණි. | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ස්ථාවර තැන්පතු ආයෝජන කිරීමට ප්‍රායෝගික දුෂ්කර වන බැවින් ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත ආයෝජනය කළ බව. | මුදල් පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) මාර්ගෝපදේශ සංග්‍රහය | 2023 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ බාහිර දේශකවරු 114 දෙනෙකු වෙනුවෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු මුදල රු.5,199,310 ක් වුවද, සාවද්‍ය ලෙස ගණනය කර රු.573,323ක් පමණක් ගෙවා තිබුණු බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත රු.4,625,987 ක බදු මුදලක් අඩුවෙන් ගෙවා තිබුණි. | මෙම ගැටළුකාරී තත්ත්වය දැනට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සමතයට පත් කර ඇති අතර බාහිර දේශකවරුන් ස්වාධීන සේවා සපයන්නන් (Independent service provider) සේ සලකා එම සේවා ඛාණ්ඩයට අදාළ වන සියයට 05 ක බදු ප්‍රතිශතය ඔවුන්ගෙන් අය කිරීමට කටයුතු කර ඇති බව. | නීති රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | චක්‍රලේඛ | | | |
| i | 2021 නොවැම්බර් 16 දිනැති අංක PE/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත ආයතනයේ විගණන වාර්තාව සමඟ ඉකුත් වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාව සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2024.03.04 දින පාර්ලිමේන්තු සභා ගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට භාරදීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සේවක සුභ සාධක යෝජනා ක්‍රමයක් වන සේවක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා 2020 අගෝස්තු සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ රු.717,000 ක මුදලක් ආයතනයේ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවා තිබුණි. | අංක 15/2018 දරන 26/11/2018 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව කළමනාකරණ මණ්ඩල අනුමැතිය සහිතව සේවක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වන ආයතනයේ දායක මුදල් ගෙවා ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය | සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වය උපරිමය සාමාජිකයින් 11 දෙනෙකුට සීමා කළ යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු නොකර සාමාජිකයින් 35 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පත් කර තිබුණි. මේ හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සඳහා සාමාජිකයින් 11 කට වඩා සහභාගී වීම වෙනුවෙන් රැස්වීම් වාර 37 ක් සඳහා එකතුව රු.2,164,263ක අමතර වියදමක් දැරීමට සිදුව තිබුණි. | මේ සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව . | චක්‍රලේඛයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.92,669,656 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.93,665,087 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.995,431 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට 2022 වර්ෂයට සාපේක්ෂව පුනරාවර්ථන ප්‍රදාන නොලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමේදී මූල්‍ය ආයතන මඟින් පොලී අනුපාත පිළිබඳව මිල ගණන් කැඳවීමකින් තොරව හා වෙළඳපල | සෑම විටම කල්පිරීමේදී රාජ්‍ය බැංකු වලින් මිල ගණන් කැඳවා ඉහළම පොලී අනුපාතයන් යටතේ ආයෝජනයන් සිදු කිරීමට | උපරිම ප්‍රතිලාභයක් අත්වන පරිදි ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පොලී අනුපාතයන්හි විචලනයන් පිළිබඳ විචක්ෂණශීලීව කටයුතු කිරීමකින් තොරව ස්වයංක්‍රීයව එකී බැංකුවේම යාවත්කාලීන කිරීම හේතුවෙන් 2022/2023 වර්ෂය තුළ ආයතනයට උපයාගත හැකිව තිබුණු රු.38,362,216 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි. | ආයතනය උත්සාහ කර ඇති බව. | |
| (ආ) | 2017 ජූලි 28 දිනැති අංක 42 දරන මූල්‍ය කමිටු තීරණය අනුව වර්ෂ 02 ක කාලයක් තුළ දේශකවරුන් විසින් ඉල්ලුම් නොකරන ලද දේශන ගාස්තු ආයතනයේ ආදායමක් ලෙස සලකා කටයුතු කළයුතු බවට තීරණය කර තිබුණු නමුත් 2015/2016 වර්ෂවලට අදාළව නිරවුල් නොකරන ලද රු.8,585,513 ක දේශන ගාස්තු වසර 08 කට වැඩි කාලයක් ගතවී තිබුණද, ආදායමට ගෙන නොතිබුණි. | 2017 ජූලි 28 දිනැති අංක 42 දරන මූල්‍ය කමිටු තීරණය අනුව වර්ෂ දෙකක කාලයක් ඉක්ම වූ 2017 හා 2018 වර්ෂයේ දෙසැම්බර් 31දිනට ඉල්ලුම් නොකල දේශන ගාස්තු ආයතනයේ ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කර තිබුණු බව. | මූල්‍ය කමිටු තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අනුව 2020 සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළයුතු පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා 06 ක් සඳහා කිසිදු ශිෂ්‍යයෙකු ලියාපදිංචි කර නොතිබුණි. | ආයතනයේ සියලු පශ්චාත් උපාධි පාඨමාලා ආවරණය වන පරිදි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුවද සමහර පාඨමාලා සඳහා කාලීනව ඉල්ලුමේ අඩු වැඩි වීම් සිදුවන බව. | සියලු පාඨමාලා සඳහා උපරිම ධාරිතාවයෙන් යුතුව සිසුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ සංචාරක නිවාඩු නිකේතනයෙන් අය කරනු ලබන ගාස්තු 2014 වර්ෂයේ සිට වියදමට සාපේක්ෂව ප්‍රමාණාත්මකව සංශෝධනය නොකිරීම හේතුවෙන් පසුගිය වසර 05 ක කාලය තුළ උපයන ලද රු.1,816,495 ක ආදායම ඉක්මවා රු.6,464,284 ක් වියදම් කර තිබුණි. | තවදුරටත් එයින් ලැබෙන ආදායම වැඩිකර ගත හැකි මාර්ග සොයා බලන බව. | වියදමට සාපේක්ෂව ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ 2017 අගෝස්තු 14 දින රු.2,100,000 කට ගිවිසුම්ගතවී අත්තිකාරම් වශයෙන් රු.1,050,000 | 2024 වර්ෂය අවසාන වන විට මෙම ගිණුම්කරණ පද්ධතිය ස්ථාපිත කර භාවිතා කිරීමට කටයුතු කිරීමට හැකි සෑම පියවරක්ම ගනු ලබන බව. | පරිගණක පද්ධතියේ කටයුතු අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක් ගෙවා තිබුණද, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 06 කට වැඩි කාලයක් ගතවී තිබුණද පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | | |

## 3.3 මානව සම්පත් කළමනාතරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිලධාරීන් ස්ථාන මාරු නොකිරීම හේතුවෙන් නිලධාරීන් 26 දෙනෙකු වසර 06 සිට වසර 39 දක්වා කාලයක් එකම ස්ථානයක සේවයේ යොදවා තිබුණි. | සියළුම පශ්චාත් උපාධි ආයතන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ ක්‍රමවේදයක් සකසා ප්‍රතිපත්තිමය තීරණයක් මත වඩාත් ගැලපෙන ක්‍රමවේදයක් සකස් කර ක්‍රියත්මක කළ යුතුව ඇති බව. | විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිලධාරීන් සේවයේ යෙදවිය යුතුය. |